# Gampaha Wickramarachchi University of Indigenous Medicine, Sri Lanka

# ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

# පුරප්පාඩු

## (විවෘත අයදුම්පත් කැඳවීම)

ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය, පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**අයදුම්පත් යොමු කිරීම**

- අයදුම්පත් මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ පමණක් ඉදිරිපත් කළ යුතු අතර, අයදුම්පත් ඉදිරිපත් කිරීම සඳහා මාර්ගගත ද්වාරය (Online portal) 2025.11.12 දින සිට 2025.12.03 දින දක්වා විවෘතව පවතිනු ඇත. වැඩි විස්තර https://gwu.ac.lk/ වෙබ් පිටුව මගින් ලබා ගත හැකි අතර. මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ අයදුම්පත් ඉදිරිපත් කිරීම සඳහා https://gwu.ac.lk/ වෙත පිවිසිය යුතුය. (අයදුම් කිරීමේ උපදෙස් වෙබ් අඩවිය ඔස්සේ ලබා ගත හැකිය)
- මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ සම්පූර්ණ කරන ලද අයදුම්පතෙහි දෘඪ පිටපතක් 2025.12.12 වන දින හෝ එදිනට ප්‍රථම ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් සහකාර ලේඛකාධිකාරී, ආයතන අනධ්‍යන අංශය, ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය, නුවර පාර, යක්කල යන ලිපිනයට එවීමට පියවර ගත යුතුය. අයදුම්පත්‍රය බහාලන ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ අදාළ තනතුර සඳහන් කිරීම අත්‍යාවශ්‍යවේ.
- අවශ්‍ය විස්තර සඳහන් නොකිරීම, අපැහැදිලිවීම, සුදුසුකම් සනාථ කිරීමට අදාළ සහතිකවල සහතික කරන ලද ඡායා පිටපත් අමුණා නොතිබීම සහ අයදුම්පත් නියමිත දිනට පසුව ලැබීම හෝ වෙනයම් අවශ්‍යතාවයක් සපුරා නොතිබීම අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට හේතුවේ. කිසියම් අයදුම්පත්‍රයක් ප්‍රතික්ෂේප කළවිට කුමන හේතුවක් නිසා හෝ යළි සලකා බලනු නොලැබේ.
- විමසීම් සඳහා රාජකාරි දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 4.00 දක්වා 0332215829 දුරකථන අංකය ඔස්සේ ඇමතිය හැකිය.

## 01. කළමනාකරණ සහකාර (III ශ්‍රේණිය)

**අවශ්‍ය සුදුසුකම් :**

1. අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය එකවර විෂයන් 06 කින් සමත්වී තිබීම සහ පහත සඳහන් විෂයන් සඳහා සම්මාන සාමාර්ථ තිබියුතු වේ.
   - සිංහල භාෂාව / දෙමළ භාෂාව
   - ඉංග්‍රීසි භාෂාව / ඉංග්‍රීසි සාහිත්‍ය
   - ගණිතය

සහ

2. අ.පො.ස. උසස් පෙළ විභාගයේ සියලුම විෂයන් එකවර සමත්වී තිබීම (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර)
3. පහත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛතාවය ලබා දෙනු ඇත.

   අ) පිළිගත් ආයතනයකින් ලබාගත් මාස හයකට නොඅඩු කාලසීමාවක පරිගණක යෙදවුම් පිළිබඳ පිළිගත හැකි සුදුසුකම්

   සහ

   ආ) පරිගණක යෙදවුම් පැකේජ භාවිතය පිළිබඳ වසර දෙකක පළපුරුද්ද

❖ ඉහත සඳහන් කළ සුදුසුකම්වලට අමතරව අයදුම්කරුවන් පහත සඳහන් සුදුසුකම් ලබා තිබිය යුතුය.

- ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
- අයදුම් කිරීමේ අවසන් දිනයට අවුරුදු 18 ට නොඅඩු සහ වයස අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.
- හොඳ චරිතයක් විය යුතුය.

**වැටුප් පරිමාණය :** UMN I (III) රු. 49,475 – 17 X 540 – 58,655 (මාසික)

(කළමනාකරණ සේවා චක්‍රලේඛ 06/2025 සහ කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2025(i) අනුව වැටුප් ගෙවනු ලැබේ)

**බඳවා ගැනීම** : ලිඛිත පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගින්.

- Knowledge in Sinhala / Tamil & English Language
- Intelligent quotient and General Knowledge
- Computer Literacy

## 02. වැඩ සහයක (III ශ්‍රේණිය)

**අවශ්‍ය සුදුසුකම් :**

අ.පො. ස. සාමාන්‍ය පෙළ විභාගය දෙවරකට නොවැඩි වාර ගණනක දී අවම වශයෙන් සම්මාන සාමාර්ථ දෙකක් සහිතව විෂයන් හයකින් සමත්ව තිබිය යුතුය.

- ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
- අයදුම් කිරීමේ අවසන් දිනයට අවුරුදු 18 ට නොඅඩු සහ වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.
- හොඳ චරිතයක් සහ මනා ශාරීරික සෞඛ්‍යයක් තිබිය යුතුය.

**වැටුප් පරිමාණය :** UPL I (III) රු. 42,775 – 16 X 450 – 49,975 (මාසික)

(කළමනාකරණ සේවා චක්‍රලේඛ 06/2025 සහ කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2025(i) අනුව වැටුප් ගෙවනු ලැබේ)

**බඳවා ගැනීම :** වෘත්තිය පරීක්ෂණයක් හා / හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්.

## 03. පුස්තකාල සහායක (III ශ්‍රේණිය)

**අවශ්‍ය සුදුසුකම් :**

1. අ.පො.ස සාමාන්‍ය පෙළ විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී අවම වශයෙන් සම්මාන සාමාර්ථ දෙකක් සහිතව විෂයයන් හයකින් සමත්ව තිබිය යුතුය.
2. අයදුම් කිරීමේ අවසන් දිනයට අවුරුදු 18 ට නොඅඩු සහ වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

- සියලුම අයදුම්කරුවන්
  - (i) ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
  - (ii) තනතුරේ රාජකාරි හොඳින් ඉටුකිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව හා මානසිකව යෝග්‍ය විය යුතුය.
  - (iii) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

**වැටුප් පරිමාණය :** UPL I (III) රු. 42,775 – 16 X 450 – 49,975 (මාසික)

(කළමනාකරණ සේවා චක්‍රලේඛ 06/2025 සහ කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2025(i) අනුව වැටුප් ගෙවනු ලැබේ)

**බඳවා ගැනීම :** වෘත්තිය පරීක්ෂණයක් හා / හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්.

## 04. මරණ පරීක්ෂක කම්කරු (III ශ්‍රේණිය)

**අවශ්‍ය සුදුසුකම් :**

1. අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිට තිබීම.
2. අයදුම් කිරීමේ අවසන් දිනයට අවුරුදු 18 ට නොඅඩු සහ වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

- සියලුම අයදුම්කරුවන්
  - (i) ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
  - (ii) තනතුරේ රාජකාරි හොඳින් ඉටුකිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව හා මානසිකව යෝග්‍ය විය යුතුය.
  - (iii) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

**වැටුප් පරිමාණය :** UPL I (III) රු. 42,775 – 16 X 450 – 49,975 (මාසික)

(කළමනාකරණ සේවා චක්‍රලේඛ 06/2025 සහ කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2025(i) අනුව වැටුප් ගෙවනු ලැබේ)

**බඳවා ගැනීම :** වෘත්තිය පරීක්ෂණයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්.

**ලේඛකාධිකාරී,**
**ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය.**
**2025.11.12**